# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා පුස්තකාල ඉතිහාසය

**කේ. ඒ. එස්. ආර්. කුලසිංහ**[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක ඉදිරි අනාගත සංවර්ධනයේ පිළිබිඹුව ලෙස අධ්‍යාපනය දැක්විය හැක. රටක ආර්ථික, දේශපාලනික, සමාජීය, සංස්කෘතික යන කුමන අංශයක් යටතේ වුව ද ඉදිරි යහපැවැත්ම උදෙසා අධ්‍යාපනයෙහි දායකත්වය ප්‍රමුඛ ලෙස සැලකිය හැකිය. මෙලෙස රටක සෑම අංශයකටම දායකත්වය සපයන අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආරම්භය පිළිබඳවත්, ඊට දායකත්වය සපයන පුස්තකාල ක්ෂේත්‍රයේ ඉතිහාසය පිළිබඳවත් අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ අරමුණු ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳවත් ලෝකයේ සහ ශ්‍රී ලංකාවේ පුස්තකාල ආරම්භය පිළිබඳවත් අධ්‍යයනය කිරීම යොදා ගෙන ඇත. මෙම අධ්‍යයනය ද්විතික දත්ත ආශ්‍රයෙන් සිදු කොට ඇති අතර ද්විතික දත්ත මූලාශ්‍ර ලෙස පොත් පත් හා සඟරා යොදා ගන්නා ලදී. එහිදී අධ්‍යාපනය හා එහි පදනම, අපේ අධ්‍යාපනය එදා අද සහ හෙට, පුස්තකාල කළමනාකරණය, පුස්තකාල ඉතිහාසය යන ග්‍රන්ථ ආශ්‍රය කර ගන්නා ලදී. එමෙන්ම දත්ත විශ්ලේෂණ කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගෙන ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රය හා සම්බන්ධ පුස්තකාල සේවය අතීතයේදී නොදියුණු තත්වයක සිට ආරම්භ වී ඇති බවත් ඒ සඳහා විවිධ කාලවකවානුවල පැවති සමාජීය තත්වය මෙන්ම විවිධ අනුග්‍රහයන්ගේ බලපෑම හේතු වී ඇති බවත් සොයා ගන්නා ලදී. එමෙන්ම වර්තමානය වන විට ඉතා ක්‍රමවත් සහ සංවිධානාත්මකව ක්‍රියාත්මක වන පද්ධතියක් ලෙස පුස්තකාල සේවාව දැක්විය හැකිය. මේ අනුව නිගමනය කළ හැක්කේ අධ්‍යාපන පද්ධතිය තුළ ලේඛන කලාවේ දී වැදගත් අංශයක් ලෙස සැලකෙන පුස්තකාල සේවාව දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන බවයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පුස්තකාල භාවිතය ඈත අතීතයේ සිටම විවිධාකාරයෙන් ක්‍රියාත්මකව පැවති අතර අධ්‍යාපන ක්‍රමය ආරම්භයේ දී නොදියුණු ක්‍රමශිල්ප අනුගමය කළ ද වර්තමානය වන විට තාක්ෂණික ක්‍රමෝපායන් පුස්තකාල භාවිතයේ දී යොදා ගෙන ඇති බවයි.

**මුඛ්‍ය පද** : අධ්‍යාපනය, පුස්තකාල, ඉතිහාසය, තාක්ෂණික ක්‍රමෝපායන්

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sithara.kulasinghe@yahoo.com